# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1989 අංක 17 දරන
# පූර්ණ වයස් (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1989 නොවැම්බර් මස 22 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


**1989 නොවැම්බර් මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරනු ලැබේ.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල: ශත 30 යි. තැපැල් ගාස්තුව: ශත 75 යි.

# 1989 අංක 17 දරන පූර්ණ වයස් (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 1989 නොවැම්බර් මස 22 වන දින]**

එල්. ඩී.—ඕ. 19/89

**පූර්ණ වයස් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ. :—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 1989 අංක 17 දරන පූර්ණ වයස් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*66 වන අධිකාරයේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පූර්ණ වයස් ආඥාපනතේ දීර්ඝ නාමය, එහි "අවුරුදු විසි එකක්" යන වචන වෙනුවට "අවුරුදු දහ අට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

*"අවුරුදු දහ අට පූර්ණ වයසට පත්වීමේ නීත්‍යානුකූල වයස බවට පත් කිරීම.*

2. මේ වගන්තිය ක්‍රියාත්මක වීමේ දින සිට සහ ඉන් පසුව, වයස අවුරුදු දහ අට සම්පූර්ණ කරන සියලු තැනැත්තන් ද දැනටමත් වයස අවුරුදු දහ අට සම්පූර්ණ කර ඇති සියලු තැනැත්තන් ද නීත්‍යානුකූල පූර්ණ වයස සම්පූර්ණ කර ඇති සේ සැලකිය යුතු අතර ඊට පටහැනිව කවර නීතියක් හෝ ව්‍යවහාරයක් තිබුණ ද මෙහි මින් මතු ව්‍යතිරික්ත පරිදි හැර, කිසිම තැනැත්තකු ඊට කලින් කාල සීමාවක පූර්ණ වයස සම්පූර්ණ කර ඇති සේ නොසැලකිය යුතු ය :

එසේ වුවද මේ පනතේ ඇතුළත් කිසිවක්, වයස අවුරුදු විසි එකට අඩු යම් තැනැත්තකුට වෙනත් යම් නීතියක් යටතේ හිමිකම ඇති යම් ප්‍රතිලාභයක් ලැබීමේ අයිතිවාසිකම් කෙරෙහි බලපාන්නාක් සේ කියවා තේරුම් නො ගත යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය එහි "වයස අවුරුදු විසි එකට" යන වචන වෙනුවට "වයස අවුරුදු දහ අටට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*අනනුකූලතාවක් ඇතිවූවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.*

5. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පතත් කෙටුම්
(විදේශීය) රු. 236 කි. කොළ
දෙසැම්බර් මස 15 වැනි දින

ර්ෂික දායක මිළ (දේශීය) රු. 177 කි.
යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම
සුව් එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා
ැකිය.